# කඨින පිංකම භාරගත් පිංවතුන් විසින් සම්පූර්ණ කළයුතු කටයුතු

- වස් ආරාධනා කිරීම.

වස් ආරාධනා කිරීම එම වර්ෂයේ කඨින පිංකම භාරගත් පිංවතුන්ගේ මූලිකත්වයෙන් අනෙක් විහාරස්ථානයට සම්බන්ධ පිංවතුන් සමග සිදු කිරීම.

## වස් තුන් මාසය තුළ සිදු කළයුතු කටයුතු

- විහාරස්ථානයට දෛනිකව පිරිනමන දානය පිළිබඳව සොයා බලා දානය නොමැති අවස්ථාවන්හි එම දානය පිරිනැමීම.
- සති අන්ත දිනයන්හි පවත්වනු ලබන ආගමික වැඩ සටහන් සඳහා දායක පින්වතුන් දැනුවත් කිරීම හා පිංකම් කටයුතු දායක පිංවතුන්ට භාරදීම.
- විහාරස්ථානයේ අවශ්‍යතාවන් සොයා බැලීම (විදුලි බල්බ, වතුර කරාම, සනීපාරක්ෂක ද්‍රව්‍ය) අත්‍යවශ්‍ය වූ විට සපයා දීම.
- හැකිනම් මාසික ජල විදුලි බිල්පත් විහාරාධිපති හිමියන්ගෙන් විමසා ගෙවීම.
- විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේලා රෝගාතුර වන අවස්ථා සොයා බලා අවශ්‍ය කටයුතු කිරීම.

## කඨින පිංකම සඳහා කළයුතු කටයුතු

- කඨින චීවරය සකස් කිරීම හා විහාරස්ථානයේ වැඩ සිටි අනෙක් භික්ෂූන් වහන්සේලාට චීවර සකස් කිරීම.
- විහාරස්ථානයේ අනෙකුත් දායක පිංවතුන් හා එක්ව කඨින පිංකම සඳහා අවශ්‍ය දානය සකස් කර ගැනීම.

- කඨින පිංකම පවත්වනු ලබන ශාලාව අවශ්‍ය දිනයට වෙන් කර ගැනීම හා ශාලාව සඳහා ගාස්තු ගෙවීම.
- කඨින පිංකම පවත්වනු ලබන ශාලාව සකස් කරගැනීම.
- කඨින පිංකම සඳහා වැඩම කරන භික්ෂූන් වහන්සේලාගේ පිරිකර සකස් කිරීම.
- පිංකම සඳහා වැඩම කරන භික්ෂූන් වහන්සේලාගේ ගමන් වියදම් විහාරාධිපති ස්වාමීන් වහස්සේගේ උපදෙස් පරිදි සකස් කිරීම.
- කඨින පෙරහැර සංවිධානය කර ගැනීම.
- කඨින පිංකම සඳහා පැමිණෙන ගිහි පිංවතුන්ගේ ආහාර පාන සංවිධානය කර ගැනීම.